1 වන පිටුවෙන්.....

# ජාතියේ සතුරෝ N.G.O.




## සර්වෝදය

**NGO** රැල්ලට වැටුණු ශ්‍රීලංකාවේ ප්‍රථම සමාජ සංවිධානය සර්වෝදය ව්‍යාපාර යයි. හැටේ දශකයේ එය ආරම්භ කරන ලද්දේ කොළඹ ප්‍රධාන පාසැලක තරුණ ගුරුවරයෙකු විසිනි. ජාතික වශයෙන් එයට විශාල අවධානයක් යොමුවිය. ඉන්දියාවේ නිදහස් සටන සමයේ එහි ග්‍රාමීය ජීවිතය නගාලන්නට ගාන්ධි, විනෝභබාවේ ආදී ඉන්දීය ජනනායක යින් ගත් **ගම නැගීමේ ව්‍යාපාරය** අනුව යමින් ලංකාවේ ග්‍රාමීය සමාජය නගා සිටුවනු වස් **මහා පිබිදීම** යන අරුතින් එම ව්‍යාපාරය **සර්වෝදය** යනුවෙන් නම් කළ බව කියති.

සර්වෝදය සංවිධානය සිය කාර්යයන් ආරම්භ කළේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ **කනතොළුව** නමැති දිළිඳු ගමෙනි. එසේම එම ගම හුලවාලි හෙවත් රොඩී යනුවෙන් හඳුන්වන කුලහීන ජනතාවක් වෙසෙන ගමකි. මෙම ගමට ගොස් සර්වෝදය ආරම්භ කළ වැඩ පිළිවෙලට මාධ්‍යය මගින් ඒ යුගයේ විශාල ප්‍රචාරයක් ලැබුණි. සර්වෝදයේ උසස් පරමාර්ථද එසේම එහි නිර්මාතෘවරයා ගැනද බොහෝ දෙනා ප්‍රශංසා මුඛයෙන් කතාකළ අතර සමහර ලොකු ලොක්කන්ද පසුව එම ව්‍යාපාරයට එකතුවනු දක්නට ලැබිණ. අද බොහෝ දෙනා තෙපලන **ශ්‍රමදානය** යන වචනය ලංකාවේ ව්‍යවහාරයට ප්‍රථම වරට එකතුවුණේ ඒ සර්වෝදය සංවිධානයෙනි.

## සර්වෝදයේ ගමන් මග වෙනස් වූ හැටි

නමුත් ටික කලක් ගතවෙත්ම සර්වෝදය ව්‍යාපාරය මුලදී ගමන්ගත් මගෙන් ඈත්ව යන බවක් සමහරුන්ට පෙනිණ. ඒ වන විට සිංහල මාධ්‍යයට වඩා ඉංග්‍රීසි පුවත්පත් මාධ්‍යයෙන් සර්වෝදය ව්‍යාපාරයට, එහි නිර්මාතෘවරයාට සහ ඔහුගේ පරමාර්ථ වලට ආදී වශයෙන් ලොකු ප්‍රචාරයක් ලැබෙමින් තිබිණ. ඒ කාලය බටහිර රටවල් පෙරදිග නොදියුණු රටවල ජනසමාජ නගා සිටුවන්නට කැප වන දේශීය සංවිධානවලට මුදල් ආධාර පිරිනමමින් සිටි යුගයකි. ඉංග්‍රීසි මාධ්‍යය හරහා විස්තර දැනගත් ජාත්‍යන්තර සංවිධාන මෙහිදී සර්වෝදයේ කටයුතු වලට මුදලින් හා විවිධ ආකාරයෙන් සහාය වන්නට පටන්ගත්තේය.

විශාල මුදල් සම්භාර ලැබෙත්ම මුලදී තමා අවතීර්ණ වුණු පරමාර්ථ සියල්ල සර්වෝදය නිර්මාතෘට අමතක විය. එම ව්‍යාපාරය ඉක්මනින්ම ලාභ ලබන පුද්ගලික සංස්ථාවක්, සමාගමක් බවට පත්වුණේය. මෙහිදී සර්වෝදය ශ්‍රීලංකාව තුළ යම් යම් සමාජ සේවා කටයුතුවල නිරත වූ බව සැබෑ නමුත් ඒ මුලදී ඔවුන් කැපවූ ශ්‍රමදාන සහ අසරණ සරණ දර්ශනයට අනුකූලවම නොවේ. මුදල් හමුවේ ඒ පරමාර්ථ ඔවුනට අමතකව ගියේ ය.

සර්වෝදය යහපත් ව්‍යාපාරයක්යයි සිතා මුලදී එයට බැඳී සිටි විද්වතුන් කීපදෙනෙකුම කලකිරී අස්වී ගිය අතර, පිටරටින් එන මුදල් දැක අවස්ථාවාදීන් කීපදෙනෙක් පමණක් එහිම රැඳුණාහ. සංවිධායකවරු ඉක්මනින් අවශ්‍යතාව හඳුනාගත්හ. එනම් රටේ සාමාන්‍ය ජනයාගේ දැනගැනීමෙන් වැඩක් නැත. අවශ්‍යවන්නේ ජාත්‍යන්තර ප්‍රචාරය සහ විදේශීය ආධාර ගලා එන ආකාරයට ප්‍රසිද්ධියට පත්වීම ය.

එක් අවස්ථාවක සර්වෝදය ශ්‍රීලංකාවේ ගම් 8000 ක වෙසෙන දිළිඳු ජනයාට ගෘහකර්මාන්ත සහ හස්තකර්මාන්ත පටන්ගන්නට මුදල් සහ අමු ද්‍රව්‍ය සපයන බවත්, එම නිශ්පාදන විකුණාගන්නටද ආධාරකරමින් ගම්වැසියන්ට ස්වයං ආදායමක් උපයා ස්වාධීනව ජීවත්වන්නට කටයුතු සළසා ඇති බවටත් වාගාඩාම්බර කීහ. මෙය සැබෑ මුසාවකි. මුළු ලංකාවේම ඇත්තේ ගම් 12,000 කි. එහෙත් ගම් 1000 කටවත් සර්වෝදය එසේ උපකාර කළේ නැතැයි තතු දන්නෝ කියති. එහෙත් එවැනි කතා සර්වෝදය ජාත්‍යන්තර මුදල් පරිත්‍යාගිශීලීන්ට කියා ඇතුවාට සැක නැත. එසේම ඒ කියන දේවල් තමා ගෙවන අරමුදල් වලින් හරියටම සිදුවෙනවාදැයි සොයා බලන්නට ද ජාත්‍යන්තරය ලංකාවට ආවේ ද නැත.

දශක දෙකකට පසු සර්වෝදය පිරිහීමට වැටිණ. 1980 දී එවකට ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතා සර්වෝදයේ ක්‍රියාවලිය ගැන පරීක්ෂාකරන්නට කොමිසමක් පත්කළේය. එහිදී සර්වෝදය ඒකාධිකාරයක් බවටද, එය දූෂණවලින් පිරී ඇති බවටද චෝදනා නැගිණ. එසේම එයට සම්බන්ධ ඉහළ අය එම ආධාර මුදල් වලින් ගම් දියුණු කරනවා වෙනුවට තම පවුලේ අය වෙනුවෙන් ඉඩම් මිළදී ගෙන ඇති බවක් ද හෙළිවිය. කොමිසම සර්වෝදයේ අයථා ක්‍රියාවලිය ගැන වාර්තාවක් දෙන්නට පෙර ප්‍රේමදාස මහතා එල්ටීටීඊ ත්‍රස්තයෙකුගේ බෝම්බයකින් මරුමුවට පත් විය. කොමිසම එතැනම නැවතිණ.

අද කනතොළුව නමැති ගම ගැන කිසිවෙකුට යාන්තමින්වත් මතක නැත. කිසිවෙක් කතා නොකරති. සර්වෝදය ද අද කාටත් අමතකව ගොස් ය. එයට සම්බන්ධ අය කොහේ ඉන්නවාදැයි සළකුණක් නැත. ශ්‍රීලංකාවේ ප්‍රථම රාජ්‍ය නොවන සංස්ථාව හෙවත් එන් ජී ඕ වේ අප්‍රසන්න ඉතිහාසය එසේ ය.

## ශ්‍රීලංකාව තුළ NGO ක්‍රියාත්මක වන ආකාරය

ශ්‍රීලංකාවේ අද දවසේ ක්‍රියාත්මක වන සියළු **NGO** හෙවත් රාජ්‍ය නොවන සංවිධාන (රා. නො. ස.)වල ක්‍රියා කාරිත්වයට ගුරුවුණු සර්වෝදයේ ක්‍රියාපටිපාටියේ ඉතිහාසය ඔබට ඉහතින් පැහැදිලි කළෙමි. කලින් සඳහන් කළාක් මෙන් 1980 දී පමණ **NGO** (රා. නො. ස.) ලංකාව තුළ හතු පිපෙන්නාක් මෙන් බිහිවන්නට වීය. 1990 දී අප රටේ රා. නො. ස. 3500 ක් ඇති බවට කතාවක් විය. සමහරු කියන්නේ ඒවා 6000 කට වඩා ඇති බවයි. **රා නො ස** ලියා පදිංචි කිරීමට ශ්‍රීලංකා රජයේ දෙපාර්තමේන්තුවක් ඇතත් නිවැරදි ගණන කිසිවෙක් නොදනිති. හරි නම් මේවා ජනතාවට හෙළි කළ යුතු කරුණුය. නම්ගම් පිටින් ජනතාව දැනගත යුතු දේවල් ය. එහෙත් එය එසේ වන බවක් නොපෙනේ.

## Enemies of the nation NGO

At latter stages with the conflicts on the ethnic problem, almost all these **NGOs** sided with the separatists and were active in trying their best to stop the armed forces from eliminating the **LTTE** terrorists.

Most of these so called **intellectuals** were writing and reporting to the international media, giving distorted information about the situation in Sri Lanka. Even today these **undercover agents** are carrying on in these tasks.

All these **'do-gooders'** write only in English in Sri Lanka's newspapers. They dare not express their views in Sinhala or Tamil for open debate. We challenge them to even translate and publish their views parallel with their publcations in English papers !

We saw how all of these **NGO frontmen** went to **Geneva** last March and together with the diaspora separatists acted with their might to attack the cause of our country.

---

ඇමරිකාව ඇතුළු බටහිර ධනවාදී රටවල් තුන්වන ලෝකයේ රටවල් ඇතුළත තම ඉත්තන් හෙවත් අතකොලු යොදවා ඇත. ඒ රටවල ඔත්තු බැලීමද, රට අභ්‍යන්තරයේ සිදුවන දේ වාර්තාකිරීමද ඒ දාසයන්ගේ කාර්‍යයයි. රාජ්‍ය නොවන සංවිධානයක් රටක ලියාපදිංචි කළ විට එය පිටරට සිට ඊට මුදල් සපයන අයට අවශ්‍ය තොරතුරු සම්පාදනය කරයි. ලංකාවේ ක්‍රියාත්මක වන බොහෝ **NGO** කරන්නේ මෙම වහල්කාරියයි. ඔත්තු සැපයීමයි. මෙම **NGO** ඒවා ක්‍රියාත්මක රටේ රජයයන්ට යටත් නැත. එසේම පක්ෂපාතීද නැත. උන්ගේ බැඳීම ඇත්තේ මුදල් ගෙවන රටටය. පිටරට **NGO** නිසා ලංකා රජය ඒ පස්සේ පන්නන්නේ නැත. එවන මුදල් කුමක් සඳහා යොදවනවාදැයි පිටරට අය නොදනිති. ඒවායේ ගණන් හිලව් බලන සිරිතක් නැත.

## ලැබෙන වාසි

**NGO එකකට වැඩකිරීම බොහෝ දෙනෙකුට ඉතා වාසිදායක ය. ලොකුමුදලක් ආදායම ලෙස ලබනවාට අමතරව සියලු ජාත්‍යන්තර පහසුකම්ද ලැබේ. වාහන, ටෙලිෆෝන්, කම්පියුටර්, විදේශ ගමන් බිමන් සඳහා ගුවන් ප්‍රවේශපත්‍ර, නිවාඩු නිකේතන සඳහා ගෙවීම් ද මීට අමතරව තානාපති කාර්යාල සමග කෙළින්ම සම්බන්ධවී වැඩ කරන්නටද ජාත්‍යන්තර මාධ්‍යයේ පුවත් පළකරවා ගැන්මට ද ඔවුන්ට හැකියාව ඇත.**

**1970 -1990** කාලයේ ශ්‍රීලංකාවේ විශ්ව විද්‍යාල විද්වතුන්, විශේෂයෙන් කොළඹ විශ්ව විද්‍යාලයෙන්, මෙම සංවිධානවලට බැඳී දැඩි උනන්දුවෙන් ක්‍රියාත්මක වූ අයුරු අපි දනිමු. ඔවුන්ගේ ඒ ඇතැම් කටයුතු ජාතික වශයෙන් හානි කර විය. රජය හා ත්‍රස්තවාදීන් අතර සිදුවූ යුද පසුබිමේදී මේ සියලුම **NGO** සංවිධාන ත්‍රස්තවාදීන්ගේ පැත්තගෙන උන්ට පක්ෂව ක්‍රියාකළ අතර යුද්ධය නවත්වන්නටද උද්ඝෝෂණය කළ හැටි අපට මතකය. ඔවුන්ට අවශ්‍ය වූයේ තමන්ට මුදල් සපයන බටහිර ස්වාමිවරුන් අණ දුන් පරිදි ප්‍රභාකරන්ට පණ බේරාගෙන පැන යන්නට ඉඩ සළසා දීම ය.

පසුගිය මාර්තු මාසයේ මේ ලංකාවේ **NGO** ගැත්තන් ජිනීවා ගොස් දෙමළ ඩයස්පෝරාව සමග එකතුව ශ්‍රීලංකාවට එරෙහිව සියළු වෛර වීරිය යොදා උද්ඝෝෂණය කළ හැටි අපි දුටුවෙමු.

මේ **NGO** කාරයින් අපේ සතුරන් යයි අප කියන්නේ ඒ නිසාය. අපේ ජනතාව මේ අභ්‍යන්තර සතුරන්ද අප රටේ ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙත ප්‍රයෝජනයට ගනිමින් රටට හානිකරව ක්‍රියාත්මක වන ජාත්‍යන්තර සතුරු බලවේගද හඳුනාගෙන කල්පනාකාරීව කටයුතු කළ යුතු ය.

# බ්‍රිතාන්‍ය පළාත් පාලන මැතිවරණයේ ශ්‍රීලංකා දේශපාලනය


බ්‍රිතාන්‍ය පළාත්පාලන ආයතන මැතිවරණය නොබෝදා නිමාවිය. ලන්ඩන්, ලිවර්පූල් වැනි ප්‍රධාන නගර 9 කට නගරාධිපතිවරුන් තෝරා ගැනීමටද, බර්මිංහැම්, මැන්චෙස්ටර්, නොටිංහැම් වැනි නගරවල නගර සභා සභිකයින් තෝරාගැන්මටද, අනිකුත් නගර සභා සහ දිස්ත්‍රික්ක සභාවන්ට සහ ග්‍රාමීය සභාවන්ට ( Parish Council) නියෝජිතයින් තෝරාගැන්මද මෙම මැතිවරණයේ දී සිදුවිය. බැලූ බැල්මට බ්‍රිතාන්‍ය පළාත් පාලන ව්‍යුහය මෙන්ම මැතිවරණ ක්‍රියාවලිය ද සංකීර්ණය. එමෙන්ම චන්දදායකයෝ ද වැඩි උනන්දුවක් නොදක්වති. සමහර නගර වල මෙවර ඡන්දය ප්‍රකාශකර තිබුණේ 20% කටත් අඩු ප්‍රමාණයකි. බ්‍රිතාන්‍ය පුරවැසියාගේ දෛනික රාජකාරි බොහොමයක් ඉටු කරන්නේ මෙම පළාත් පාලන ආයතන වලිනි. කෙසේ වෙතත් ලන්ඩන් පුරපතිවරයා තෝරාගැන්මේ මැතිවරණය මුළු එක්සත් රාජධානියේම කාගේත් අවධානයට ලක්විය.


Boris Jonson

ලන්ඩන් පුරපති තරඟයට ප්‍රධාන අපේක්ෂකයෝ දෙදෙනෙක් වූහ. කම්කරු පක්ෂයේ කෙන් ලිවිංග්ස්ටන් සහ කොන්සර්වේටිව් පක්ෂයේ බොරිස් ජොන්සන් ඒ දෙදෙනා ය. මේ දෙදෙනම තම මැතිවරණ ව්‍යාපාරයේදී ලන්ඩනයේ වෙසෙන ඡන්දය හිමි විවිධ ජාතීන්ගේ ප්‍රසාදය දිනාගැන්මට බෙහෙවින් උත්සුක වූහ. මේවාට වඩාත් ලක්වූයේ ලන්ඩන් නගරයේ වෙසෙන ශ්‍රීලාංකියන්ය.

දෙමළ හා සිංහළ යනුවෙන් ශ්‍රීලාංකියින් දෙකොටසක් සිටින බව හා ඒ දෙපිරිස අතර ඇති විරෝධතාද බොරිස් ජොන්සන් හා කෙන් ලිවිංග්ස්ටන් දෙදෙනම මනාව දැන සිටිති. ඒ ලාංකික දෙපිරිසේ හිත සැනසීමට ඔවුන් ඉල්ලන දෙයකට පොරොන්දු වීම ඔවුන්ගේ ඡන්ද තමනට ලබාගැන්මේ ක්‍රමයක් බව අපේක්ෂක දෙදෙනාම දැන සිටිති.

තමා දිනුවොත් **LTTE** නායක ප්‍රභාකරන්ගේ ස්මාරකයක් ලන්ඩනයේ පිහිටුවන්නට තමා ඉඩදෙන බව ජොන්සන් මෙහි ද්‍රවිඩ අයට කියා ඇත. එසේම ඔහුම සිංහළයින් හමුවූ විට සිංහළ බස ලන්ඩනයේ භාවිතාකරන භාෂාවක් බවට පත්කරන්නට තමා එකඟ වන බවට සිංහළ අයට ප්‍රතිඥා දී ඇත.


Ken Livingston

කෙන් ලිවිංග්ස්ටන් දෙමළ අයට පොරොන්දු වූයේ ලංකාව යුද්ධය ජයග්‍රහණය කළ මැයි 19 වන දිනයේදී ලන්ඩනයේ ප්‍රභාකරන් සැමරුම් උළෙලක් පවත්වන්නට තමා ඉඩ දෙන බවය. එසේම ඔහුම සිංහළ අයට කීවේ වෘපල්ගා චතුරශ්‍රය සිංහළ අයගේ ඕනෑම උත්සවයකට තමා ලබාදෙන බව ය.

මෙම අපේක්ෂකයින්ගේ දෙපැත්ත කෑම ලන්ඩන් වාසී සිංහළ හා දෙමළ අය බාරගත්තේ තමනට දැක්වූ පක්ෂපාතීකමක් ලෙසට ය. එබැවින් ශ්‍රීලාංකික සිංහළ හා දෙමළ කොටස් සිය හිතවතුන්ට දුරකතන පණිවුඩ මගින්ද **SMS** යවමින්ද අපේක්ෂකයින් දෙදෙනා තමන්ට දෙන්නට යන සහයෝගය ගැන කියමින් ඔවුන්ට ඡන්ද ඒකරාශි කරන්නට වෙහෙස වූහ.

අවසන් ප්‍රථිඵලය වූයේ බොරිස් ජොන්සන් තම ප්‍රතිවාදියා වන කෙන් ලිවිංග්ස්ටන් පරදා ලන්ඩන් නගරාධිපතිධූරය දෙවන වතාවටද හිමිකර ගැන්මයි. එසේම තවත් පැහැදිලි වූ කරුණක් නම් ප්‍රභාකරන් ඇතුලු සමස්ත **LTTE** යම සිංහළ විරෝධී එමෙන්ම රට දෙකඩ කරගන්නට මාන බලන ත්‍රස්තවාදීන් ලෙස අප සිතන නමුත් බොරිස් හෝ කෙන් කිසිසේත් එසේ නොසිතන බවය. ඔවුන් නියෝජනය කරන ලේබර් සහ කොන් සර්වේටිව් පක්ෂ ද එසේ සිතන්නේ නැත. ඔවුන්ට අවශ්‍ය ලාංකිකයින්ගේ ඡන්ද ටික පමණ ය.

♦ මේජර් වී. බී. කරුණාරත්න
Major V. B. Karunaratne
Oxford UK